# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2102/27 - 2018 දෙසැම්බර් මස 19 වැනි බදාදා - 2018.12.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබාගැනීමට රජය අදහස් කරන බැවි 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාව විස්තර:*

නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ පදියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බින්තැන්න පත්තු දකුණ සුළු කොට්ඨාසයේ මීගස්වත්ත ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද පදියතලාව ටො.පො.පී.පී. 49, අතිරේක අංක 54 හි කැබලි අංක 3516 දරන බිම් කැබැල්ල ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0126 වන වලගමවත්ත නැමැති ඉඩම් කැබැල්ලට මායිම්:

*උතුරට*: කැබලි අංක 3517; *නැගෙනහිරට*: කැබලි අංක 3517; *දකුණට*: කැබලි අංක 3517 හා 1622; *බටහිරට*: කැබලි අංක 1622.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019.01.09 වැනි දින පෙ. ව. 10.00 ට පදියතලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2019.01.09 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවය, එකී ඉඩම්/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ආර්. එම්. එන්. විජයතුංග,
ප්‍රාදේශීය ලේකම්,
පදියතලාව.

පදියතලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01 - 73

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1A - G 29117 - 12 (2018/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.